# වර්ණ පවුලට අයත් වචන පසකට සංස්කෘත, ඉංග්‍රීසි කෝෂ ග්‍රන්ථානුසාරයෙන් ඉදිරිපත් වන නිර්වචන පිළිබඳ අධ්‍යයනයක්

නාකුළුගමුවේ සුමනරතන හිමි[1]

සංස්කෘත හා ඉංග්‍රීසි භාෂාවල ජාති, කුල, කුලක, වර්ණ හා වර්ග යන වචන පස සඳහා ඇතැම් විට විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇතත් කෝෂ ග්‍රන්ථානුසාරයෙන් ඒ සම්බන්ධ ව විධිමත් පර්යේෂණාත්මක හෝ වාග්විද්‍යාත්මක පදනමක පිහිටා කෙරුණු විශ්ලේෂණයක් තව මත් දැකිය නොහැකි ය. කිසියම් වපසරියක සීමා පරාසයක් නියෝජනය කරමින් මේ වචන පස පිළිබඳ ව මේ පර්යේෂණයේ සාකච්ඡා කෙරේ. උදාහරණයක් ලෙස කුලය යන්න සැලකූ විට එය නාම විශේෂණයක් ලෙසින් කුලය, සමාජය, පද්ධතිය, ව්‍යූහය යනාර්ථයෙන් නිර්වචනයට ලක් වෙයි. එහෙත් එහි ආරය, නිලය, ධනය, වෘත්තිය වැනි සාමාර්ථ මත පදනම් වූ ස්ථාවරයක් ඇතැ යි කිව හොත් ඒ කෙසේ දැ යි යනුවෙන් කෙනකුට ගැටලුවක් ඇති විය හැකි ය. අනෙක් අතට කුල යන්නෙන් කිසියම් නිත්‍ය නාමයකින් පට බැඳි කිසියම් ගෝත්‍රයක්, පිරිසක් යන සරල අදහස ම හැඟෙයි නම් ඒ සඳහා රංචුව (Herd), රැළ (Troop), රොත්ත (Flock), සන්නිපාතය (Assemblage), මහජනයා (Multitude), සමූහය (Number) වැනි සමූහාර්ථවාචී නියුජ්‍ය නාම (Pronoun) යොදා ඇත්තේ කුමක් නිසා දැ යි යන ගැටලුව පැන නැඟේ. මීට හාත්පසින් වෙනස් ව කුලයේ නම් උද්භිද විද්‍යාවේ දී 'ආසේ' යනුවෙන් ද සත්ත්ව විද්‍යාවේ දී 'ඉඩේ' යනුවෙන් ද අවසන් වේ. එනිසා ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති නිර්වචන අනුසාරයෙන් ඉහත කී වචන පඤ්චකය විධිමත් ව විශ්ලේෂණය කිරීම මේ විමර්ශනයේ අභිප්‍රාය යි.

**ප්‍රමුඛ පදඃ** වර්ණ, කෝෂ ග්‍රන්ථ, නිර්වචන

[1] සංස්කෘත අධ්‍යනාංශය